# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මැතිවරණ (විශේෂ විධිවිධාන)

**මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා සහ දඩ මුදල් වැඩි කිරීම සඳහා ද; (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 අගෝස්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූලි මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[195 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මැතිවරණ (විශේෂ විධිවිධාන)

එල්.ඩී.-ඕ. 9/2023

**මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා සහ දඩ මුදල් වැඩි කිරීම සඳහා ද; (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම

පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 262 වන අධිකාරයේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම

**2.** පළමුවන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ වගන්ති, එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්ය සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට එහි III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 82 අඉ වගන්තිය සංශෝධනය කිරීම

**3.** 2002 අංක 1 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 82අඉ වගන්තියේ (1) වන උපවගන්තියේ "දින විසි එකක් ඇතුළත" යන වචන වෙනුවට "දින හතලිස් දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

## II වන කොටස

## 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම

*දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 1981 අංක 1 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම*

**4.** දෙවන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ වගන්ති, එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්ය සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට එහි III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තිය සංශෝධනය කිරීම*

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "දින විසි එකක් ඇතුළත" යන වචන වෙනුවට "දින හතලිස් දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## III වන කොටස

## 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත සංශෝධනය කිරීම.

*තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 1981 අංක 15 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම*

**6.** මෙහි තුන්වන උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ වගන්ති එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්ය සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට එහි III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම*

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "දින විසි එකක් ඇතුළත" යන වචන වෙනුවට "දින හතලිස් දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## IV වන කොටස

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.

හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 1988 අංක 2 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම

**8.** මෙහි හතරවන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ වගන්ති, එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්ය සඳහා, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට එහි III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "දින විසි එකක් ඇතුළත" යන වචන වෙනුවට "දින හතලිස් දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### පළමුවන උපලේඛනය

(2 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 11 | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 18(6) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 39අ (3) | රුපියල් පන් සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 39අ (3අ) | රුපියල් පන් සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 39ආ (1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 43 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 52(2) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 53අ (4) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 77 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 78(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 81අ (3) | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 81ආ (2) | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 82ඉ (1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 82ඊ (1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 82ඔ (1) | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| 82ඕ (1) | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| 84අ (2) | රුපියල් පන් සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 85අ | රුපියල් පනහක් | රුපියල් විසි පන්දහසක් |
| දෙවන උපලේඛනය | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |

දෙවන උපලේඛනය

(4 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 5 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 18 | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 26(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 27(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 27(4) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 43(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 67(2) | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 68(1) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 68(2) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 69 | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 70 | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 72 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 73(3) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 74(2) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 75(1) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 76(6) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 81(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 82(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 87(1) | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| 88(1) | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| 121(2) | රුපියල් පනහක් | රුපියල් විසි පන්දහසක් |
| 122(2) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |

## තුන්වන උපලේඛනය

(6 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 6 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 23(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 24(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 24(4) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 41(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 67(2) | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 68(1) | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 68(2) | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 69 | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 70 | රුපියල් එක්සියයකට | රුපියල් පනස් දහසකට |
| 72 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 73(3) | රුපියල් එක්සියයකට | රුපියල් පනස් දහසකට |
| 74(2) | රුපියල් එක්සියයකට | රුපියල් පනස් දහසකට |
| 75(6) | රුපියල් පන්සියයකට | රුපියල් ලක්ෂ දෙකකට |
| 80(1) | රුපියල් පන්සියයකට | රුපියල් ලක්ෂ දෙකකට |
| 81(1) | රුපියල් පන්සියයකට | රුපියල් ලක්ෂ දෙකකට |
| 86(1) | රුපියල් තුන්සියයකට | රුපියල් ලක්ෂයකට |
| 87(1) | රුපියල් තුන්සියයකට | රුපියල් ලක්ෂයකට |
| 109(2) | රුපියල් පනහක් | රුපියල් විසි පන්දහසක් |
| 110(2) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |

හතරවන උපලේඛනය

(8 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධිත වගන්ති | ඉවත් කළ | ඇතුළත් කළ |
| 6 | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 16 | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 24(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 25(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 25(4) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 41(3) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 64 | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 67(2) | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 68(1) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 68(2) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 69 | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 70 | රුපියල් එක් දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 72 | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 73(3) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 74(2) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 75(1) | රුපියල් එක් සියයක් | රුපියල් පනස් දහසක් |
| 76(3) | රුපියල් එක්දහසක් | රුපියල් ලක්ෂ හතරක් |
| 77(6) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 82(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 83(1) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| 88(1) | රුපියල් තුන් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 89(1) | රුපියල් තුන් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 123(2) | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |
| දෙවන උපලේඛනය 9(4) අයිතමය | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂ දෙකක් |